

# දේපළ රක්ෂණය

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

1.

# දේපළ රක්ෂණය යනු කුමක්ද?



දේපළ රක්ෂණය මගින් රක්ෂණ ඔප්පුහිමියන්ගේ දේපළ වලට විය හැකි හානිය සඳහා ආවරණයක් ලබා දේ.

යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි, තොග යනාදී දේපළ වලට ගින්නකින්, සොරකමකින් හෝ අයහපත් කාළගුණික තත්ව හේතුවෙන් සිදුවන හානි ආවරණය කිරීම සඳහා රක්ෂණාවරණයක් ලබාදීම දේපළ රක්ෂණය මගින් සිදුවේ.

**දේපළ රක්ෂණයට ඇතුලත්වන රක්ෂණ වර්ග මොනවාද?**

- ගිනි රක්ෂණය

ගින්නකින් දේපළ වලට සිදුවිය හැකි හානි සඳහා ආවරණයක් ලබාදීම ගිනි රක්ෂණය මගින් සිදුවේ. මෙමගින් ප්‍රධාන වශයෙන් ගින්න, අකුණු ගැසීම්, ගෘහස්ත කටයුතු වලට යොදා ගන්නා ගෑස් හෝ පීඩන උපකරණ පිපිරීම්, විදුලි කාන්දුවීම්, වැනි අවදානම් නිසා දේපළ වලට වන හානි ආවරණය කෙරේ.
ගිනි රක්ෂණය යටතේ ආවරණය කරගත හැකි දේපළ කිහිපයක් පහතින් දැක්වේ.

- ව්‍යාපාරික ගොඩනැගිලි හා නිවාස
- ගෘහභාණ්ඩ
- යන්ත්‍ර සූත්‍ර
- කර්මාන්තශාලා
- අර්ධ නිමි /නිමි භාණ්ඩ තොග යනාදිය

# 2.

# සම්මත ගිනි රක්ෂණ ඔප්පුවක් යටතේ ලැබෙන ආවරණ




**රක්ෂණය කරන ලද දේපළට**

- ගින්න (ඔප්පුව විසින් බැහැර කරන ලද උපද්‍රව හැර) (fire)
- විදුලි කෙටීම් (Lightning)
- පිපිරීම් (ගෘහස්ථ කටයුතු සඳහා භාවිතා කරන බොයිලේරු, ගෑස්) (Explosions) සහ
- විදුලි කෙටි පරිපථයකින් ගිනි ගැනීම (Short Circuiting)

මගින් සිදුවන හානියට ආවරණයක් ලබාදීම නැතහොත් හානිපූරණය කිරීම ගිනි රක්ෂණ ඔප්පුවේ විධිවිධාන මගින් සලස්වා ඇත. යම් අවස්ථාවකදී හානිය ඇති වූයේ ගින්නක් නිසාද යන බව නිශ්චය කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගතයුතුය.

- නියත ගින්නක් හෝ ගිනි ගැනීමක් සිදුවී තිබිය යුතුය.
- ගින්නක් හටගත යුතු නොවූ යම් දෙයක් ගිනිගෙන තිබිය යුතුය.
- එය අහඹු හෝ අවිනිශ්චිත විය යුතුය.

3.

## සම්මත ගිනි රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන වෙනත් උපද්‍රව




- ගින්න නිවාදැමීම සඳහා භාවිතා කරනු ලබන ජලය හෝ වෙනත් ගිනි නිවන මාධ්‍යයක් නිසා සිදුවන දේපළ හානි
- සැබෑ ගින්නෙන් පැන නැගුණු දුම හා තාපය නිසා සිදුවන හානි
- ගින්නක් හටගැනීමේදී යම් අයිතමයක් රත්වීම හේතුවෙන් පිපිරුම් ගණයට නොවැටෙන පිපිරුම් හානි උදා: මුද්‍රා තබන ලද පීප්ප (බැරල්)
- ගොඩනැගිල්ලේ යම් කොටසක්, බිත්ති, වහල ආදිය කඩා වැටීම හෝ ගිනිගෙන දැවෙන ගොඩනැගිල්ලේ ගින්නට හසුනොවූ හෝ යාබද භූමිභාගයක ඇත්තා වූ දේපළකට ගොඩනැගිල්ලේ යම් කොටසක් කඩාවැටීම නිසා සිදුවන හානි
- ගින්න නිවාදැමීම / පැතිරීම වැළැක්වීම සඳහා හෝ යම් ජීවිතයක් බේරාගැනීමට හෝ දේපළ බේරාගැනීමට, රක්ෂිතයා / ගිනි භටයින් / වෙනත් උදව්කරන්නන් ආදීන් ගන්නා උත්සාහයේදී ඔවුන්ගෙන් සිදුවන හානි

# 4. සම්මත ගිනි රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය නොවන / බැහැර කරනු ලබන උපද්‍රව



සම්මත ගිනි රක්ෂණ ඔප්පුවක් මගින් ආවරණය නොවන උපද්‍රවවලින් කිහිපයක් පහත සඳහන් කර ඇති අතර මෙම උපද්‍රව හේතුවෙන් වන හානි සම්මත බැහැර කිරීම් ලෙස සලකනු ලබයි.

- සුළිසුළං, කුණාටු, චණ්ඩමාරුත, හෝ වෙනත් වායුගෝලීය කැළඹීම්
- යුද්ධ උපද්‍රව : යුද්ධය, සිවිල් යුද්ධය, එදිරිවාදිකම්, විදේශීය සතුරන්ගේ ක්‍රියා, ආක්‍රමණ සහ යුද්ධය ප්‍රකාශ කළත් නොකළත් යුද්ධයක් වැනි ක්‍රියා දාමයන්
- පිපිරීමක් (ගෘහ කටයුතු සඳහා පාවිච්චි කරන ගෑස් හැර)
- භූමිකම්පා, ගිනිකඳු පිපිරීම හෝ ස්වභාව ධර්මයේ වෙනත් කැළඹිලි යනාදිය
- ගින්නක් සිදුවන අතරතුර හෝ එයින් පසුව සොරකමක් නිසා සිදුවන අලාභ
- යම් පොදු බලධාරියෙකුගේ නියෝගයක් මත දේපළ ගිනි තැබීම; සහ
- භූගත ගින්නක් යනාදිය

සම්මත ගිනි රක්ෂණාවරණයකින් ආවරණය නොවන උපද්‍රව හේතුවෙන් වන හානි සඳහා ආවරණ ලබාගැනීමට ඔබගේ සේවාව ලබාගන්නා රක්ෂණ සමාගම සමග සාකච්ඡා කර අමතර වාරික මුදලක් ගෙවා රක්ෂණ ඔප්පුවට ඇතුළත් කර ගැනීමටද හැකියාවක් ඇත.

උදා : සුළි, කුණාටු, ගංවතුර උපද්‍රව (Cyclone, Flood Damages)
භූමිකම්පා (Earthquake)
ත්‍රස්ත ක්‍රියාකාරකම් (Terrorism)
ස්වයං දහනය (Spontaneous Combustion)
ද්වේශ සහගත ක්‍රියා (Malicious Damages)
වැඩවර්ජන සහ කැරලි කෝළහාල(Strike & Riot)
ස්වාභාවික උපද්‍රව (Natural Perils)

5.

# සොරබිය රක්ෂණය



සොරබිය රක්ෂණය ව්‍යාපාර පරිශ්‍රයන්ට හා නිවෙස් සඳහා ලබාගත හැක. මෙමගින් බලහත්කාරයෙන් සහ ප්‍රචණ්ඩ ලෙස පරිශ්‍රය තුලට ඇතුල් වී සොරකම් කිරීම හේතුවෙන් දේපළ අහිමි වීම හෝ හානි වීමට අදාල අවදානම සඳහා ආවරණය ලබා දෙනු ලැබේ. මෙම රක්ෂණය යටතේ පරිශ්‍රය තුළ ඇති බඩු බාහිරාදිය, තොග ඇතුලුව අනිකුත් භාණ්ඩ සඳහා ආවරණයක් සපයයි. ඊට අමතරව සොරකම අතරතුරදී හෝ ඊට උත්සහ කිරීමේදී පරිශ්‍රයට හෝ නිවෙස් වලට වන හානිද මෙම රක්ෂණය යටතේ ආවරණය කරගත හැකිය. තවද, ඔබ විසින් කරනු ලබන විශේෂ ඉල්ලීමක් මගින් පරිශ්‍රය තුළ වූ සේප්පුවල ඇති මුදල්, වටිනා බඩු බාහිරාදිය හා සුරැකුම්පත් වැනි දෑ සඳහා සිදුවන හානිද මෙමගින් ආවරණය කරගත හැකි වේ. දේපළ හානිය කොපමණ වටිනාකමකින් යුක්ත වුවද, රක්ෂණ සමාගම ගෙවීමට බැඳී සිටිනුයේ රක්ෂිත මුදල දක්වා පමණි. රක්ෂිත මුදල ප්‍රමාණවත් නොවූ විට ගෙවනුයේ සිදුවූ අලාභහානි වටිනාකමින් කොටසකි. එබැවින් රක්ෂණය මිලදී ගැනීමේදී අදාල දේපළෙහි/වත්කමෙහි සැබෑ වටිනාකමට රක්ෂණය ලබාගැනීමට සැලකිලිමත් විය යුතුය.

සම්මත සොර බිය රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය නොවන / බැහැර කරනු ලබන උපද්‍රව, එනම් රක්ෂිත දේපළට සිදුවන අලාභ හෝ හානි සම්මත බැහැර කිරීම් ලෙස සලකනු ලබන අතර ඉන් සමහරක් පහත දැක්වේ.

- ගිනි හෝ පිපිරීම් නිසා සිදුවන හානි
- අදාළ ස්ථානයේ නීත්‍යානුකූලව සිටින යම් තැනැත්තෙකු සම්බන්ධ වී සිදුකරන අලාභ/හානි
- පැතලි විදුරු හෝ ඕනෑම සැරසිලි හෝ අකුරු වලට වන හානි සහ
- ඔප්පුව මගින් රක්ෂණය කරන ලද බවට නිශ්චිතව සඳහන් කර නොතිබේ නම් මුදල්, ඔප්පු, බැඳුම්කර, මැණික්ගල්, සවර්ණාභරණ, වටිනා ඛණිජ, ලියකියවිලි හෝ වෙනත් යම් වටිනා දේ යනාදියට සිදුවන අලාභ හෝ හානි.

6.

## සමුද්‍රීය රක්ෂණය





ආරම්භක රටකින් ගමනාන්තය දක්වා භාණ්ඩ ප්‍රවාහනයේදී සිදුවන අවදානම් ආවරණය කිරීම සඳහා වන රක්ෂණය මේ නමින් හඳුන්වයි. මෙහිදී භාණ්ඩ මෙන්ම, මුහුදු යාත්‍රා හා සමුද්‍රීය ප්‍රවාහනයට අදාල බැඳීම් රක්ෂණය කළ හැක.

භාණ්ඩ මුහුදින්, ගුවනින් හා ගොඩබිම හරහා එක් තැනකින් තවත් තැනකට යැවීම සිදු කරනු ලබනතාක්කල් ප්‍රවාහණයේදී සිදුවන අවදානම් හේතුවෙන් වන හානි සමුද්‍රීය රක්ෂණය මගින් ආවරණය කෙරේ. බොහෝ අපනයන වෙළඳ ගිවිසුම් හරහා භාණ්ඩ ප්‍රවාහනයේදී සමුද්‍රීය රක්ෂණය අනිවාර්ය වේ. ගිවිසුමේ කොන්දේසි අනුව රක්ෂණයේ පිරිවැය ගෙවීම අපනයනකරුවන්ගේ හෝ ආනයනකරුවන්ගේ වගකීම විය හැක.

සමුද්‍රීය රක්ෂණය සාමාන්‍යයෙන් කොටස් තුනකින් යුක්තය.

1. නැව් බඩු (Cargo) - නැව් බඩු මුහුදින්, ගුවනින් හා/හෝ ගොඩබිම් හරහා එක් තැනකින් තවත් තැනකට යන තාක්කල් ප්‍රවාහනයේදී සිදුවන නැතිවීම් හෝ හානිය සම්බන්ධයෙන් රක්ෂණය කරනු ලැබිය හැකිය.

2. මුහුදු යාත්‍රා රක්ෂණය (Hull) - මුහුදු යාත්‍රා රක්ෂණය මගින් නැව් අයිතිකරුවන්ගේ වත්කම්වලට එනම් යාත්‍රාවට සිදුවන භෞතික අලාභය හෝ හානි සම්බන්ධයෙන් ආවරණය කෙරේ. තවද යාත්‍රාවේ කඳ හෝ වානේ තහඩුද එමෙන්ම ඇන්ජිම සහ අතිරේක යන්ත්‍ර සූත්‍ර ද ආවරණය වේ.



3. සමුද්‍රීය බැඳීම් (Liability) - සමුද්‍රීය බැඳීම් යන්නට අධිකාරපත්‍රධාරියාගේ බැඳීම්, නැව අයිතිකරුගේ බැඳීම්, නැව් අළුත්වැඩියා කරන්නන්ගේ බැඳීම් මෙන්ම, බඩු නැව්ගත කරන්නන්ගේ බැඳීම් පිළිබඳ රක්ෂණය ඇතුළත් විය හැකිය.

**සමුද්‍රීය රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය නොවන / බැහැර කිරීම් සමහරක් පහත පරිදි වේ.**

- රක්ෂිතයා විසින් හිතාමතා කරන හානි
- ඇසුරුම් ප්‍රමාණවත් ලෙස / නිසි ආකාරයෙන් සිදු නොකිරීම නිසා සිදුවන හානි
- ප්‍රමාද වීම් නිසා සිදුවන හානි
- න්‍යෂ්ඨික ක්‍රියාකාරකම් නිසා වන හානි
- යුද්ධය, වැඩ වර්ජන, කැරලි හා සිවිල් කෝළහාල සහ
- මුල්‍ය ගෙවීම් පැහැර හැරීම නිසා සිදුවන හානි යනාදිය

7.

# විවිධ රක්ෂණ




අහඹු (අනතුරු) සහ වගකීම් යන පුළුල් අංශ දෙක ඇතුළත් පුළුල් පරාසයක ඔප්පු, විවිධ අහඹු හා වගකීම් රක්ෂණය මගින් ආවරණය වේ. මේ යටතේ විවිධ රක්ෂණ වර්ග පවතින අතර ඉන් සමහරක් පහත පරිදි වේ.

- ව්‍යාපාරික පරිශ්‍ර සඳහා වූ ගෙවල් බිඳීමේ රක්ෂණය (Burglary and Housebreaking Insurance for Business Premises)
- ගිනි හා සොරකම් සඳහා සංයුක්ත ආවරණය (Combined Fire and Burglary)
- විශ්වාස ඇප සහතික රක්ෂණය (Fidelity Guarantee)
- සියලු අවදානම් රක්ෂණය (All Risk Insurance)
- වීදුරු රක්ෂණය (Glass Insurance)
- පුද්ගල හදිසි අනතුරු රක්ෂණය (Personal Accident Insurance)
- ශල්‍ය සහ ආරෝග්‍යශාලා රක්ෂණය (Surgical and Hospitalization Insurance)
- කම්කරු වන්දි රක්ෂණය (Workmen's Compensation Insurance)
- මහජන වගකීම් රක්ෂණය (Public Liability Insurance)
- නිෂ්පාදන වගකීම් රක්ෂණය (Product Liability Insurance)
- වෘත්තීය වගකීම් රක්ෂණය (Professional Indemnity Insurance)

## දේපළ රක්ෂණයේ වැදගත්කම කුමක්ද?




### දේපළ රක්ෂණයේ වැදගත්කම කුමක්ද?

ඔබගේ නිවසේ හෝ ව්‍යාපාරික ආයතනයේ සිදු වන සොරකමක් නැතහොත් ගින්නක් හේතුවෙන් වන හානිය ඔබගේ මූල්‍යමය ස්ථාවරත්වයට දැඩිලෙස බලපෑම් කළ හැක. දේපළ රක්ෂණයක් මිලදීගැනීම මගින් ඔබගේ දේපළවලට වන හානිය, හානිපූරණය කරගත හැකි වේ. එය ඔබගේ දේපළ නැවත යථා තත්වයට පත්කර ගැනීමට මහඟු උපකාරයක් වන අතර මානසික සහනය උදෙසාද බලපානු ඇත.

### දේපළ රක්ෂණයක් මිලදීගැනීමේදී දැනුවත් විය යුතු වැදගත් කරුණු මොනවාද?

- රක්ෂණාවරණයක් ලබාගත හැක්කේ ඔබට නීත්‍යානුකූල අයිතියක් ඇති දේපළ සඳහා පමණක් බව දැනුවත් වන්න.
- හිමිකම්පෑමකදී හිමිකාරිත්වය හා වටිනාකම සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන ඔබ සතුව ඇති බවට වගබලා ගන්න
- රක්ෂණාවරණය ලබාගැනීමට අවශ්‍ය දේපළෙහි සම්පූර්ණ හා නිවැරදි විස්තර ලබාදෙන්න
- යෝජනා පත්‍රය ඔබ විසින්ම පිරවීමට උත්සහ ගන්න. වෙන අයෙකු යෝජනා පත්‍රය සම්පූර්ණ කළහොත් එය හොඳින් කියවා බලා තොරතුරු නිවැරදිනම් පමණක් අත්සන් කරන්න.
- අදාල දේපළ පිළිබඳ කිසිදු තොරතුරක් සැඟවීමකින් තොරව හෙළිදරව් කරන්න
- දේපළෙහි වටිනාකම අසත්‍ය ලෙස ප්‍රකාශ කර අනවශ්‍ය ගැටලු වලට මුහුණ පෑමෙන් වළකින්න

### දේපළ රක්ෂණාවරණයක් මගින් සාමාන්‍යයෙන් ආවරණය නොවන හානි මොනවාද?

- දේපල හිතාමතාම විනාශ කිරීම හේතුවෙන් වන හානි
- යුද්ධය, ආක්‍රමණ නිසා වන හානි
- දෝෂ සහිත ඉදිකිරීම් හේතුවෙන් සිදුවන හානි
- න්‍යෂ්ටික ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන හානි
- නීතිවිරෝධී කටයුතුවලට යෙදී සිටින විට දේපළවලට වන හානි
- පරිසර දූෂණය හේතුවෙන් වන හානි යනාදිය

# 9.

# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ආකාරය



**රක්ෂණ හිමිකමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා පැමිණිලි විභාග කිරීම සිදු කරන අතර, ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

පළමුව ඔබගේ රක්ෂණ සමාගම වෙත පැමිණිල්ල යොමුකරන්න. රක්ෂණ සමාගමට පැමිණිල්ල යොමු කරන ආකාරය ගැන දැනගැනීම සඳහා https://ircsl.gov.lk/list-of-insurance-companies/ වෙත පිවිසෙන්න. සමාගම සාධාරණ කාලසීමාවක් ඇතුළත එය නිරාකරණය කර, ඒ සඳහා ඔබට පිළිතුරක් ලබා දිය යුතුය.

ඔබට රක්ෂණ සමාගමෙන් සාධාරණ කාලසීමාවක් තුල පිළිතුරක් නොලැබුනොත් හෝ පැමිණිල්ල නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබ සෑහීමකටපත් නොවන්නේ නම්, ඔබගේ පැමිණිල්ල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කල හැකිය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://ircsl.gov.lk/policyholder-complaints/ වෙත පිවිසෙන්න.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවට මාර්ගෝපදේශයක් වශයෙන් දේපල රක්ෂණයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳ මෙම අත්පොත නිකුත් කර ඇති අතර මෙහි ඒ පිළිබඳ සාමාන්‍ය තොරතුරු පමණක් අඩංගු වේ. මෙහි දක්වා ඇති කිසිදු තොරතුරක් රක්ෂණ ඔප්පුවක නියමයන් සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතික්ෂේප නොකරයි. රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සඳහා හෝ වෙනත් අමතර තොරතුරු සඳහා රක්ෂණ සමාගම, රක්ෂණ තැරැව්කාර සමාගම හෝ රක්ෂණ නියෝජිතයා අමතා ලබා ගත හැක.

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහළ, නැගෙනහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය - 0112 2396184-9 I ෆැක්ස් - 0112 2396190
විද්‍යුත් තැපෑල - mder@ircsl.gov.lk

www.ircsl.gov.lk

https://www.facebook.com/Ircslofficialpage/

https://www.linkedin.com/company/insurance-regulatory-commission-of-sri-lanka/

https://www.youtube.com/channel/UCuM9RLGQTi7B2MM7PL7jfiA

බැඳියාව හා නොපිළිගැනීම
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කරන ලද අතර කිසිදු නීතී උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් මෙය උපයෝගී කරගත නොහැක.